සංශෝධනයයි

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ නිලධාරී ( ප්‍රමාණ සමීක්ෂක)තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2025</u>

අංක 2,468 හා 2025.12.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළාත් සභා කොටසේ පළ කර තිබූ මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ නිලධාරී ( ප්‍රමාණ සමීක්ෂක)තනතුරු පුරප්පාඩු වලට බඳවා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීමේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2026.01.23 දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. එම නිවේදනයේ, 1. පොදු සුදුසුකම් සඳහන් ඡේදයෙ හි අනු අංක 1.3. හි සඳහන් 1991.01.09 යන දිනය 1996.01.09 වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

03. තවද එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කාරුණිකව දැනුම් දෙමි.

04. දැනටමත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස නිවේදනය කරනු ලැබේ.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.